මාධ්‍යකරණයේදී තමන් භාවිතා කරනා මූලාශ්‍රයක අනන්‍යතාවය හෙළි කිරීමට මූලාශ්‍රයේ අවසරය නොලැබෙන අවස්ථාවක, මාධ්‍යවේදියෙකුට සිය මූලාශ්‍ර හෙළි නොකොට සිටීමට හැකියාවක් ඇත. එවැනි මොහොතකදී වුවත්, තමන් ඉදිරිපත් කරන කරුණු කාරණා ඔප්පු කිරීමට සාක්ෂි සාධක මාධ්‍යවේදියා සතුව තිබිය යුතු වේ. එසේම මූලාශ්‍ර රහිතව මතයන් හෝ අනුමානයන් ඉදිරිපත් කිරීමටද නොහැක. මූලාශ්‍ර නොදැක්වීම සාමාන්‍ය භාවිතාව නොවිය යුතු අතර, හැකි සෑම විටකම මූලාශ්‍රයන් ඉදිරිපත් කිරීම ඔස්සේ පුවතක විශ්වසනීයත්වය ඉහළ යනු ඇත.

එවන් පසුතලයක, දිවයින ඉරිදා සංග්‍රහයේ (03/07) මුල් පිටුවේ ප්‍රධාන පුවත ලෙසින් "උතුරේ වෙනම රටක් හදන්න ඇමරිකාව සල්ලි විසි කරයි" යන සිරස්තලයෙන් යුතුව මූලාශ්‍ර නොමැති පුවත් වාර්තාවක් ඉදිරිපත් වීම පාඨක අප අරුත් ගන්වාගත යුත්තේ කෙසේද? මූලාශ්‍ර සඳහන් නොකර සිටිය හැකි පදනම අපි ඉහළ දක්වා ඇති මුත්, මූලාශ්‍ර නැති අසත්‍ය පුවත් වාර්තාවන්ද ඒ අයුරින්ම ප්‍රකාශයට පත් කිරීමට ඇති හැකියාවද නොසලකා හැරිය හැකි නොවේ.

එසේ නම්, මෙම ඉරිදා දිවයින පුවතේ කරුණු වලට විශ්වාසනීය මූලාශ්‍ර පදනමක් තිබේ දැයි පාඨක අප ඇසිය යුතුය. යම් හෙයකින් එම ලිපියේ කරුණු සඳහා නිසි මූලාශ්‍ර පදනමක් නැති නම්, එය මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් නොවේද යන්නද අප එලෙසින්ම විමසිය යුතුය.

මූලාශ්‍ර:
https://www.ap.org/about/news-values-and-principles/telling-the-story/anonymous-sources
https://ethics.journalists.org/topics/confidential-sources/

#MediaEthicsSL #lka #SinhalaPress #SundayDivaina